# සුනඛ වන්ධ්‍යාකරණ කිරීම - 2025

## සම්බන්ධ විස්තර හා කොන්දේසි පිළිබඳ මාර්ගෝපදේශනය

****************************************************************************************************

ඌව පළාත් බදුල්ල / මොණරාගල දිස්ත්‍රික්ක දෙකහි 2025 වර්ෂ සඳහා සුනඛ වන්ද්‍යාකරණය සිදුකර ගැනිම සඳහා සුදුසුකම් ලත් ආයතන සහ පුද්ගලයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| අ.අ | දිස්ත්‍රික්කය | ලංසු ආකෘතිපත්‍ර ගාස්තුව රු. | ආපසු ගෙවන ලංසු ඇපකරය | |
|---|---|---|---|---|
| | | | මුදලින් රු. | බැංකු ඇපකරයේ වටිනාකම රු. |
| 01. | බදුල්ල දිස්ත්‍රික්කය තුළ සුනඛයින් 300ක් හා මොණරාගල දිස්ත්‍රික්කය තුළ සුනඛයින් 300ක් a වන්ද්‍යාකරණය කිරීම | 3500.00 | 40,000.00 | 80,000.00 |

**ලංසු කරුවන්ට උපදෙස්**

1. ලංසු ආකෘතිපත්‍ර සමග පහත සඳහන් ලියවිලි නොඅඩුව හා සම්පූර්ණව පිළිවෙලින් ඉදිරිපත් කළ යුතුය.
   I. ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පත ඇමුණුම 01
   II. ලංසු ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය ඇමුණුම 02
   III. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය (අයිතිකරුවන්, කොටස්කරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ විස්තර සහිතව )
   IV. ලංසු බැදුම්කරය.
   V. ආදායම් බදු ගෙවන බව සනාථ කරන ලේඛන.
   VI. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල වෘත්තිය සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය සපයා ගැනීමට ඇති හැකියාව සහතික කරන ලිපියක් සනාථ කර ගැනිමට අදාල සහතික වල පිටපත් හා එසේ සේවය කිරීමට කැමැති බවට වන ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය.
2. එක් ලංසු කරුවෙකුට ඉදිරිපත් කල හැකි වනුයේ එක් ලංසුවක් පමණි. කුමන හෝ ආකාරයකින් ලංසුපත් එකකට වඩා ඉදිරිපත් කොට තිබේ නම් එසේ ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට යටත් වේ.
3. ලංසු අයදුම්පත්‍රය සහ අදාළ කරුණු, සියලු ලේඛන යථා පරිදි සම්පූර්ණ කොට ලංසුකරු විසින් අත්සන් කළ යුතුය.
4. ලංසු පත්‍රය සමග වගුවේ සඳහන් වටිනාකම ඇති ශ්‍රී ලංකාවේ පිළිගත් බැංකුවකින් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමට ලියන ලද 2025.11.28 දින දක්වා වලංගු වන, කොන්දේසි රහිත ලංසු බැදුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත එක් එක් ආයතනයට ඉහත වගුවේ සඳහන් වටිනාකම ඇති මුදල තැන්පත් කොට පොදු 172 රිසිට් පතක් ද ඒ සඳහා ඉදිරිපත් කළ හැකිය.
5. ලංසුකරුවන් දුස්සද්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය, සම්පූර්ණකොට ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

**<u>ලංසු කොන්දේසි</u>**

- සියලු ශල්‍ය කර්ම සුදුසුකම් ලත් පශු වෛද්‍යවරුන් විසින් සිදු කළ යුතුය.
- සෙනසුරාදා හා ඉරිදා හා රජයේ නිවාඩු දිනවල වන්ද්‍යාකරණ කටයුතු සැලසුම් නොකළ යුතුය. සතියේ දිනවල උදෑසන 6.00 සිට සවස 4.00 දක්වා පමණක් වන්ද්‍යාකරණ කටයුතු සැලසුම් කළ යුතු අතර දිනකට එක් පශු වෛද්‍ය වරයෙකුට වන්ද්‍යාකරණය කළ හැකි උපරිම ගැහැණු සතුන් සංඛ්‍යාව 50 නොඉක්ම විය යුතුය.
- ශල්‍ය කර්මයේදී ගැහැණු සුනඛයින්ගේ ගර්භාෂය හා ඩිම්බකෝෂ සම්පූර්ණයෙන් ඉවත් විය යුතුය.
- ඖෂධ සහයකයින් ඇතුළු අනෙකුත් පහසුකම් අයදුම්කරු විසින් සපයා ගත යුතුය.
- ගිවිසුම්ගත කාලය තුළ බදුල්ල දිස්ත්‍රික්කයේ සුනඛයින් 300ක් ද මොණරාගල දිස්ත්‍රික්කයේ සුනඛයින් 300ක්ද ශල්‍ය කර්මයට භාජනය කළ යුතුය.
- **ඖෂධ ද ඇතුළුව ගැහැණු සුනඛයින්ගේ ශල්‍යකර්මය සඳහා අවශ්‍ය මුදලද සුනඛයින් ඇල්ලීම සඳහා අවශ්‍ය මුදලද වෙන වෙනම සඳහන් කල යුතුය.**
- **ශල්‍යකර්ම වලට භාජනය කරනු ලබන සියළුම සතුන්ගේ හඳුනා ගැනීම සඳහා සළකුණක් යෙදිය යුතුය. (මෙම සළකුණ සම්බන්ධව දෙපාර්ශවයම එකඟ විය යුතුය)**
- **ශල්‍යකර්ම වලට භාජනය කරනු ලබන ගෘහස්ත (අයිතිකරුවන් සිටින) සුනඛ ගැහැණු සතුන්ගේ කනෙහි ඇතුලත අංකයක් සළකුණු කල යුතු අතර එය ඡායාරූප ගතකර අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ලබා දිය යුතු අතර ශල්‍යකර්ම වලට භාජනය කරනු ලබන දඩාවතේ යන සුනඛයින්ගේ කනෙහි අග V හැඩයේ සළකුණක් යෙදිය යුතුය.**
- වන්ද්‍යාකරණයට ලක්කළ සුනඛයන්ගේ ඡායාරූප ගැනීම්දී ඒ සඳහා Android ජංගම දුරකථනයක් භාවිතා කරමින් GPS Coordinates APP මෘදුකාංගය තුළින් සිදු කළ යුතු බව. මෙම ක්‍රමවේදය සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අංශය මගින් හඳුන්වා දී ඇති අතර ඒ අනුව කටයුතු කිරීම පිළිබඳ අදාළ කොට්ඨාසයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක උපදෙස් ලබාදෙනු ඇත.
- **ශල්‍යකර්ම වලට භාජනය වන සියළුම සතුන් සාමාන්‍ය පරිදි සාමාන්‍ය තත්ත්වයට පත්විය යුතුය.**
- **ශල්‍යකර්ම වලට භාජනය වන සියළුම සතුන්ගේ හා අයිතිකරුවන්ගේ ලේඛණයක් ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංක සහිතව පවත්වාගෙන ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීම සමඟ ඉදිරිපත් කල යුතුය.**
- **ශල්‍යකර්ම සහ ඉවත් කල ඩිම්භකෝෂ 02 එකට තබා අල්පෙනෙති 2කින් අමුණා 10% ෆෝමලින් දියරය අඩංගු බෝතලයක ගබඩා කිරිම සඳහා (එක් එක් වන්ද්‍යාකරණ මධ්‍යස්ථානයක් සඳහා එක් බෝතලය බැගින්) මධ්‍යස්ථානයේ නම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නම සහ අත්සන සහිත ලේබලයක් බෝතලයේ අලවා දිනය අවසානයේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අත්සන සහිතව සිල් තබා සුදුසු ස්ථානයක තැන්පත් කරන්න. එමෙන්ම පසු විපරම් සඳහා මාස 12කට වැඩි කාලයක් මෙම ඩිම්භකෝෂ ෆෝමලින් දියරයේ බහා තබා ගත යුතු බැවින් එසේ සුරක්ෂිතව තබා ගැනිමට හැකි පරිදි කටයුතු කරන්න**
- **සියළුම ගෙවීම් වවුචර් සහ සුනඛයින්ගේ ලේඛණයක් ක්ෂේත්‍ර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සත්‍ය බවට සහතික කොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් ද සහතික කොට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතුය.**
- **සේවා සපයන්නාගේ දුරකථන අංක සේවාලාභි ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්යය මණ්ඩලය වෙත ලබා දිය යුතු අතර, සුනඛයින්ගේ යම් සංකූලතාවක් ඇති වුවහොත් ඒ පිළිබඳ අදාළ කටයුතු ඉටු කල යුතුය.**
- **මෙවැනි වැඩසටහන් පිළිබඳව අයදුම්කරුගේ පළපුරුද්ද සහ සාර්ථකත්වයද සැලකිල්ලට ගනු ලැබේ.**

**වෙනත් කරුණු:-**

1. ඉදිරිපත් කොට ඇති ලංසු තාක්‍ෂණ ඇගැයිම් කමිටුව වෙත ඔවුන්ගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කරන අතර, අනතුරුව ප්‍රසම්පාදන මණ්ඩලය විසින් සාර්ථක ලංසුකරු තෝරා ගනු ලැබේ.

2. සාර්ථක ලංසුකරු තෝරා ගෙන ගිවිසුම අත්සන් කළ පසු අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු බැදුම්කර නිදහස් කරනු ලැබේ.

3. සාර්ථක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට වැඩ කරන දින 10 ක් ඇතුළත එයට සාර්ථක ප්‍රතිචාරයක් නොදක්වන ලද්දේ නම් ඊලඟ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබාදීම පිළිබඳ සලකා බැලීමට ප්‍රසම්පාදන මණ්ඩලයට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන්ට ඉදිරියේදී ලංසුපත්‍ර නිකුත් නොකිරීමට කටයුතු කරනු ඇත.

4. සාර්ථක ලංසුකරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ සමඟ වාර්ෂික කොන්ත්‍රාත්තුව නිසි අයුරින් පවත්වාගෙන යන බවට ගිවිසුමකට බැඳිය යුතුය.
5. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිරීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් බල පැවැත්වේ.
6. කොන්දේසි වලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් එය ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂගේ අභිමතය පරිදි තීරණය වේ.
7. සාධාරණ හා නීත්‍යානුකූල හේතූන් මත මෙම ටෙන්ඩරය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීමේ බලය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.
8. ලංසු ප්‍රදානය කිරීමෙන් පසු වෙනත් කෙනෙකුට පැවරීමට හෝ අතුරු බදු දීම සපුරා තහනම්ය.
9. ලංසුපත්‍රවල සටහන් කරන ලද යම් දෙයක් කපා හෝ මකා අමුතුකිරීම් (ටිපෙක්ස්) වෙනස් කලහොත් ඒ සෑම ස්ථානයකම ලංසුකරුගේ කෙටි අත්සන් යෙදිය යුතුය.

ලංසුකරු ගෙවීම් ලේඛණ ඉදිරිපත් කිරීමෙන් පසු පවරා ඇති සෑම අංශයකම වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටු කර තිබෙන බවට අදාල නිලධාරීන් සහතික කිරීමෙන් පසුව ලංසුකරුට අදාල ගෙවීම් සිදු කරනු ඇත.

කොන්ත්‍රාත්කරු යටතේ සේවයේ යොදවන ලද සේවකයින් කම්කරු දෙපාර්තමේන්තුවේ සියලුම නීති රීතිවලට අනුකූලව සේවයේ යෙදවිය යුතු අතර, ඔවුන්ට වැටුප් නිවාඩු දින වැටුප්, අතිකාල, පාරිතෝෂික, සේවක අර්ථ සාධක අරමුදල්, දායක සේවක භාරකාර අරමුදල් දීමනා හා වෙනත් සියලුම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම පිළිබඳ වගකීම සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුවේ. මේ පිළිබඳව කිසිම වගකීමකට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවත්නා ආයතන බැඳී නොසිටී.

සුනඛ වන්ධ්‍යාකරණය කිරීම පරීක්‍ෂා කිරීමේ බලය ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරීන් ද සුනඛ වන්ධ්‍යාකරණය සිදු කරනු ලබන ආයතනයේ අධ්‍යක්‍ෂවරයා හෝ බලය පැවරූ වෙනත් නිලධාරියෙකු සතුය.

ඉහත සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොයෙදවීම, සේවයේ අසතුටුදායක බව හෝ වෙනත් පැමිණිල්ලක් විභාග කිරීමේ බලය ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සතුවන අතර, ඒ සඳහා සුදුසු දඩ මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර, ඒ දඩ මුදල ගෙවීමට සේවා සැපයුම්කරු බැඳී සිටී.

සේවා සැපයුම්කරු හෝ ඔහුගේ සේවකයින් විසින් සේවා සපයනු ලබන ආයතනයට ගෙවීමට සිදුවන යම් මුදලක් වේ නම් එම මුදල සේවා සැපයුම්කරු වෙත ගෙවීමට නියමිත මුදලින් අඩුකර ගැනීමට සේවා ලබන ආයතන ප්‍රධානියාට බලය ඇත.

සේවා සැපයීම හා ඒ සම්බන්ධ තත්වයන් දිගින් දිගටම අසතුටුදායක වේ නම් අදාල සේවා සැපයුම්කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරයාට බලය ඇත. එසේම එයට යටත්වීමට සේවා සැපයුම්කරු බැඳී සිටී.

10. මිල ගණන් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීම ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

11. ශබ්‍යතාවය ඔප්පු කිරීම.

සැපයුම්කරුවන් තම අයදුම්පත් සමග අපේක්‍ෂිත කටයුතු ඉටුකිරීමේ හැකියා සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය.

12. කාර්යසාධන බැඳුම්කරය

සාර්ථක ලංසුකරු විසින් කොන්ත්‍රාත්තුවේ වාර්ෂික වටිනාකමින් 10% වු මුදලක් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ නමින් මුදලින් තැන්පත් කිරීම හෝ ඒ හා සමාන වටිනාකමින් යුතු මුදලක් සඳහා පිළිගත් බැංකුවකින් ලබා ගත් කොන්ත්‍රාත් කාලය සඳහා වලංගුවන බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කළ යුතුය. තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටුකිරීම අසතුටුදායක බව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂට පෙනී ගියහොත් සහ ඔහු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩ කර ඇත්නම් ඔහුට එම කාර්යසාධන බැඳුම්කරයේ හිමිකම් අහිමි කිරීමටත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂට බලය ඇත.

13. නිතිය අදාලවීම

මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පිරිනැමෙන කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බල පැවැත්වෙන නිතිය අදාල වන අතර මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් විසඳීම ආරවුල් විසඳීම පිළිබඳ 1995 අංක 11 දරණ පනතේ විධිවිධාන පරිදි සිදු කරනු ලැබේ.

14. කොන්ත්‍රාත්කරු විසින් ඇප වශයෙන් තැන්පත් කරනු ලබන මුදල් වලට කිසිදු පොලියක් ගෙවනු නොලැබේ.

15. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වනු ඇත.

16. **ලංසු ඇගයීමේ දර්ශක**

1. නියමිත වටිනාකමට ලංසු ඇපකර ඉදිරිපත් කර තිබේද යන වග.
2. පසුගිය වර්ෂ තුනක සේවා පළපුරුද්ද.
3. ප්‍රමාණවත් වෘත්තිය සුදුසුකම් සහිත සේවක සංඛ්‍යාවක් සිටින බවට සහතික.
4. අසාදු ලේඛන ගත කරන ලද සැපයුම්කරුවෙකු ද යන වග.
5. අදාල කාලයට බලපැවැත්වෙන පරිදි පශු වෛද්‍ය සංගමයේ ලියාපදිංචි සහතික.
6. ලංසු පත්‍රය සමඟ එහි සඳහන් කර ඇති අනෙකුත් ලියකියවිලි ඉදිරිපත් කර තිබේද යන්න.